# ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

**(2014 අංක 31 දරන පනත යටතේ වන රාජ්‍ය විශ්වවිද්‍යාලයකි)**

# පුරප්පාඩු

## ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර

## ධීවර හා සාගර විද්‍යා පීඨය - සාගර විද්‍යා දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය වනාහි ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය, නාවික, සමුද්‍රික හා සමුද්‍රාසන්න කටයුතු පිළිබඳ අංශවල මිනිස්බල සැපයුම් අවශ්‍යතා කෙරෙහි සිය වගකීම් භාරය උසුලන ආයතනයකි.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය විසින් පහත දැක්වෙන තනතුරු සඳහා යෝග්‍යතා සපිරි, සුදුසුකම්ලත් අයවළුන් වෙතින් අයදුම්පත් භාරගනු ලැබේ.

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශ්‍රේණිය - I**

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය**

**සාගර විද්‍යා දෙපාර්තමේන්තුව සඳහා වන විශේෂඥතා ක්ෂේත්‍ර**

භෞතික විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය සහ භෞතික / රසායනික / භූ විද්‍යාත්මක සාගර විද්‍යාව (Oceanography) පිළිබඳ පශ්චාත් උපාධිය හෝ සාගර විද්‍යාව පිළිබඳ අදාළ ක්ෂේත්‍රයේ, ආචාර්ය (දර්ශනශූරි) උපාධිය

හෝ

ගණිතය පිළිබඳ ප්‍රථම උපාධිය සහ භෞතීය සාගර විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය හෝ සාගර විද්‍යාව පිළිබඳ අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය (දර්ශනශූරි) උපාධිය

සැ.යු.: බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR) පරිදි අදාළ වන අධ්‍යාපනික සුදුසුකම් අපේක්ෂකයින් හට තිබිය යුතුය.

**වැටුප් පරිමාණය**

**(අ) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය**

රු. 91,310 – 7 X 2,170 – 106,500 (මාසිකව) [u-AC3(I)]

**(ආ) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය -**

රු. 79,360–11 X 1,630 – 97,290 (මාසිකව) [u-AC3(I)]

ඉහත වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව අධ්‍යාපනික / ශාස්ත්‍රාලීය දීමනාව, පර්යේෂණ සංවර්ධන දීමනාව සහ පාලක මණ්ඩලය විසින් අනුමත කර ඇති වෙනත් දීමනාද, තෝරාගනු ලබන අපේක්ෂකයින්හට ගෙවනු ලැබේ.

අයදුම්පත් ආකෘති පත්‍ර සහ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය, 2021 දෙසැම්බර් මස 07 වන දින දක්වා, සාගර විශ්වවිද්‍යාලයේ, වෙබ් අඩවිය වන www.ocu.ac.lk මගින් බාගත කරගත හැකිය. නියමිත හා විශේෂිත ආකෘති පත්‍රය මගින් එවනු ලබන අයදුම්පත් පමණක් භාරගනු ලැබේ. (කරුණාකර, අදාළ ලිපිලේඛනවල පිටපත් අමුණා එවන්න) නිසි පරිදි සම්පූර්ණ කර ලද අයදුම්පත් ආකෘතිපත්‍ර අඩංගු ලිපිකවරයේ, වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන ලබන තනතුරේ නම පැහැදිලිව සටහන් කර එවනු මැනවි. එම අයදුම්පත් 2021 දෙසැම්බර් මස 07 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ, කොළඹ 15, මට්ටක්කුලිය, පඤ්ඤානන්ද මාවතේ, අංක 51 හි, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ, සහකාර ලේඛකාධිකාරී, මානව සම්පත් සංවර්ධන වෙත, ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ කළ යුතුය. විශ්වවිද්‍යාල පද්ධතියේ / රජයේ දෙපාර්තමේන්තුවල / රාජ්‍ය සංස්ථාවල සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයගේ අයදුම්පත් ස්වකීය අදාළ ආයතන ප්‍රධානීන් වෙතින් ලබාගත් නිර්දේශ සහිතව, එවිය යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනෙන් පසු ලැබෙන (ප්‍රමාදව) අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත්, සහ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ, නියමිත ආකෘතිය අනුව සකස් නොකර එවනු ලබන අයදුම්පත්ද පූර්ව දැනුම් දීමකින් තොරව, ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය,**
**කාකදූපත මට්ටක්කුලිය,**
**කොළඹ 15.**

**2021 නොවැම්බර් මස 28 වන දින**